සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2017 ජනවාරි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2017-01-21
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත යුනිවෙබ් ලංකා (පෞද්ගලික) සමාගම,** ඕස්ට්‍රේලියාව පාදක කරගත් **යුනිවෙබ් ඉන්ටර්නැෂනල් සමාගමේ** පරිපාලිත (subsidiary) සමාගමකි. **සීමාසහිත යුනිවෙබ් ලංකා (පෞද්ගලික) සමාගම, යුනිවෙබ් ඉන්ටර්නැෂනල් සමාගමේ** සංස්ථාපිත ගනුදෙනුකරුවන් සඳහා මෘදුකාංග වැඩසටහන් සංවර්ධනය කිරීමේ නිරතව සිටී. සමාගමට ආදායම් ලැබෙන්නේ විදේශීය මුදල් වලිනි.

**සීමාසහිත යුනිවෙබ් ලංකා (පෞද්ගලික) සමාගමේ** ව්‍යාපාරික කටයුතුවලට බලපානු ලබන ආර්ථික සාධක තුනක්(03) සහ තාක්ෂණික සාධක දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත ඊමොබයිල් (පෞද්ගලික) සමාගම,** ජංගම දුරකතන විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටියි. අභ්‍යන්තර අවදානම් සහ බාහිර අවදානම් යන දෙයාකාරයෙන්ම ව්‍යාපාරයට බලපෑම් සිදුවන අතර, අවදානම් සම්පූර්ණයෙන්ම මග හරවා ගැනීමට සමාගමට නොහැකි වේ.

(A) **සීමාසහිත ඊමොබයිල් (පෞද්ගලික) සමාගමට** බලපෑම් කළ හැකි අභ්‍යන්තර අවදානම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(B) **සීමාසහිත ඊමොබයිල් (පෞද්ගලික) සමාගමේ** අවදානම් අවම කිරීම සඳහා (to mitigate) යොදාගත හැකි ශිල්පීය ක්‍රම වර්ග දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

මෙහෙයවීම, අධීක්ෂණය සහ සමාලෝචනය (direction, supervision and review) යනු තනි තනි විගණනයන් හි තත්ත්ව පාලනය සඳහා සලකා බැලිය යුතු ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි වේ. තනි විගණන කාර්යයක තත්ත්ව පාලනය සඳහා සහතිකවීමේ හවුල්කරු (engagement partner) විසින් අවසාන වශයෙන් වගකිව යුතු වන්නේය.

(A) විගණන හවුල්කරු විසින් මෙහෙයවීම යටතේ විගණන කණ්ඩායමේ සාමාජිකයන්ට සන්නිවේදනය කළ යුතු කරුණු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(B) විගණනයක් කරගෙන යාමේදී අධීක්ෂණය යටතට ඇතුලත් කළ යුතු කාර්යයන් දෙකක්(02) **සඳහන් කරන්න**.

(ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

අභ්‍යන්තර පාලන පද්ධතිය යනු සංවිධානයේ අරමුණු සහ ඉලක්ක ඉටුකර ගැනීමට සංවිධානයට උපකාරවීම සඳහා කළමනාකරණය විසින් හඳුන්වා දී ඇති ක්‍රියාවලින් වේ. කෝසෝ (Committee of Sponsoring Organizations - COSO) අනුව අභ්‍යන්තර පාලන පද්ධතියක සංරචක පහක් තිබේ. පාලන පරිසරය (control environment) සහ පාලන ක්‍රියාකාරකම් (control activities) යනු කෝසෝ හි සංරචක පහ අතුරෙන් දෙකකි.

(A) "පාලන පරිසරය" (Control Environment) යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**.

(ලකුණු 02)

(B) පාලන ක්‍රියාකාරකම් තුළ ඇතුලත් වන අභ්‍යන්තර පාලන වර්ග තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයන් (AAT members) විසින්, ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය විසින් නිකුත් කර ඇති ආචාරධර්ම සංග්‍රහයෙහි (Code of Ethics) අවශ්‍යතාවයන්ට, අනුකූල වීම අවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(A) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයන්ට අදාල වන මූලික මූලධර්ම (fundamental principles) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(B) මූලික මූලධර්ම වලට අනුකූල වීමේදී ඇතිවන පහත සඳහන් තර්ජන (threats) **පැහැදිලි කරන්න**:

(a) ස්වයං ඇල්ම මත තර්ජනය (Self-interest).

(b) උපදේශන මත තර්ජනය (Advocacy).

(c) සුහදශීලී වීමේ තර්ජනය (Familiarity). (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත ලේටස්ට් ෆැෂන්ස් (පෞද්ගලික) සමාගම** කාන්තා ඇඟළුම් සිල්ලර ව්‍යාපාරයක නිරතව සිටී. සමාගමේ ගනුදෙනුකරුවන් වනුයේ ප්‍රධාන වශයෙන් ම ඉහළ ආදායම් උත්පාදනය කරන පාර්ශවයන්ය. සෑම මාස 6 කට වරක් සමාගම නව මෝස්තර එකතු කරනු ලැබේ. ඊට පසු, වට්ටම් කළ මිල ගණන් යටතේ පැරණි මෝස්තර වල ඇඳුම් විකුණනු ලැබේ. **සීමාසහිත ලේටස්ට් ෆැෂන්ස් (පෞද්ගලික) සමාගමේ,** ප්‍රධාන කොටස්හිමියන් දෙදෙනා විසින් මෙම සමාගම කළමනාකරණය කරනු ලැබේ. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ විගණකයන් වන **SP ඇසෝසියේට්ස්**, පහත සඳහන් කරුණු සටහන් කරගෙන ඇත:

(1) පසුගිය වර්ෂයේ සිට නොවිකිණෙන (non-moving) අයිතම ලෙස රු. මිලියන 50 ක් වටිනා ඇඟළුම් ඉතිරිව තිබුණි. කෙසේවෙතත්, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. තොග, පිරිවැය මත අගය කරනු ලැබේ. නොවිකිණෙන අයිතම වල ශුද්ධ උපලබ්ධි අගය ගණකාධිකාරී විසින් ඇස්තමේන්තු කරන ලද අතර, එය රු. මිලියන 20 කට ඇස්තමේන්තු කර තිබුණි. විගණක විසින් මෙම ගණනය කිරීමේ සාධාරණ බව ස්වාධීනව පරීක්ෂා කරන ලද අතර ගැටළු සහගත කිසිවක් අවධානයට ලක්වී නොතිබුණි.

(2) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන **සීමාසහිත ලේටස්ට් ෆැෂන්ස් (පෞද්ගලික) සමාගමේ** විගණනයෙහි සමස්ථ ප්‍රමාණාත්මක මට්ටම (overall materiality level) රු. මිලියන 18 ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය යෝග්‍ය ආකාරයෙන් ගණනය කර ඇත.

(3) කොටස්හිමියන්ගේ අපේක්ෂාව වන්නේ මෙම ව්‍යාපාරයෙන් නියත ලාභාංශ ලබාගැනීමයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(A) ඉහත විස්තර කරන ලද ගැටළුව නිසා **සීමාසහිත ලේටස්ට් ෆැෂන්ස් (පෞද්ගලික) සමාගමේ** 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණක වාර්තාව කෙරෙහි ඇතිවන බලපෑම (impact) **තක්සේරු කරන්න.**

(ලකුණු 04)

(B) එකිනෙක සඳහා යෝග්‍ය උදාහරණයක් බැගින් දක්වමින් කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් සහිත විගණන වාර්තාවකින් (an audit report with emphasis of matter paragraph) විකරණය කළ විගණන වාර්තාවක් (a modified audit report) **වෙනස්කොට දක්වන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත මොනාව් (පෞද්ගලික) සමාගම (මොනාව්)** සිල්ලර වෙළඳාමෙහි යෙදී සිටී. ව්‍යාපෘතියක් සඳහා අරමුදල් ලබා ගැනීමට බැංකුවක් සමඟ **මොනාව්** ගිවිසුමකට එළඹුණි. ගිවිසුමේ ප්‍රතිපාදන අනුව, අර්ධ වාර්ෂිකව (bi-annually) පිළියෙල කරනු ලබන ගිණුම් ප්‍රකාශන, **මොනාව්** විසින් බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුත්තේ ගිවිසුමේ ඇති නිර්ණායකයන් අනුව වේ. මෙම මූල්‍ය ප්‍රකාශන විගණනයට යටත් කළ යුතු වේ.

එමනිසා, **මොනාව්** හි කළමනාකාරිත්වය විසින් සහතිකවීමේ කාර්යභාරයක් (assurance engagement) සිදුකර, විශේෂ අරමුණුගත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්තාවක් නිකුත් කරන ලෙස **S සහ S සමාගමෙන්**, ඉල්ලා සිටින ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සහතිකවීමේ කාර්යභාරයක ප්‍රධාන මූලිකාංග (key elements) **පැහැදිලි කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත SSI (පෞද්ගලික) සමාගම, (SSI)** විදේශීය වෙළෙඳපොළ සඳහා පාවහන් නිෂ්පාදනයෙහි නිරත වූ සමාගමකි. දැනට එහි කර්මාන්තශාලා සේවකයන් 300 ක් සේවයේ යොදවා සිටී. පැමිණීම සටහන් කිරීම සඳහා එක් එක් සේවකයාට පන්ච් කාඩ් පතක් (punch card) නිකුත් කර තිබේ. එක් එක් සේවාමුරය ආරම්භයේදී හා අවසානයේ දී පන්ච් කාඩ් පත යන්ත්‍රයේ සටහන් කළ යුතුය. කෙසේවෙතත්, ස්වයංක්‍රියව ක්‍රියාත්මක කෙරෙන නිසා සහ කිසිවෙකුට වේලාව වෙනස් කළ නොහැකි නිසා, මෙම ක්‍රියාවලිය කිසිම නිළධාරියෙකුගේ අධීක්ෂණයකට ලක් නොවේ.

සමාගමේ සියලුම අලුත් පත්වීම් මානව සම්පත් දෙපාර්තමේන්තුවෙන් සිදුකෙරෙන අතර, අලුත් සේවකයන් වැටුප් සැකසීමේ පද්ධතියට (payroll system) ඇතුලත් කිරීම කරනු ලබන්නේ මානව සම්පත් විධායක විසිනි.

අතිකාල ගෙවීම් ද වැටුප් සැකසීමේ පද්ධතිය මගින් ගණනය කරනු ලබන අතර, මසකට දෙවතාවක් ගෙවීම් කරනු ලැබේ. අතිකාල ගෙවීම් කළ පසු නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අතිකාල වාර්තා නිෂ්පාදන අධීක්ෂකයන් වෙත යවනු ලැබේ.

පැමිණීමේ වාර්තා මත පදනම් ව සේවකයන්ට පැමිණීමේ ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ. ගෙවිය යුතු ප්‍රමාණයන් නිෂ්පාදන අධීක්ෂකයන් විසින් තීරණය කරනු ලබන අතර වැටුප් ලිපිකරු විසින් එම ගණන් වැටුප් සැකසීමේ පද්ධතියට ඇතුලත් කරනු ලැබේ.

සියලුම කර්මාන්තශාලා සේවකයන්ට මුදලින් වැටුප් ගෙවීම් කරනු ලබන අතර, වැටුප් ලිපිකරු විසින් වැටුප් පැකැට්ටු (pay packets) සේවකයන් අතරේ බෙදාදෙනු ලැබේ. ඔහු කර්මාන්තශාලාවේ සියලුම සේවකයන් පුද්ගලිකව දන්නා බැවින් ඔහු විසින් කරනු ලබන ගෙවීම් සඳහා වැටුප් බාර දුන් බවට ලියවිල්ලක් ලබා නොගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත විස්තර කර ඇති වැටුප් සැකසීමේ පද්ධතියේ (payroll system) පවතින අභ්‍යන්තර පාලන දුර්වලතා හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(b) ඉහත (a) හි හඳුනාගත් එක් එක් දුර්වලතාවය **SSI** හි කළමනාකාරීත්වය විසින් මගහරවා ගන්නේ කෙසේදැයි යන්නට නිර්දේශයක් බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) පරිගණකගත වැටුප් සැකසීමේ පද්ධතියක් භාවිත කිරීම ආශ්‍රිතව ඇති ප්‍රධාන අවදානම් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(d) (i) වැටුප් සැකසීමේ පද්ධතියේ අන්තර්ගත සහ එයට ඇතුලත් කරනු ලබන තොරතුරු ශක්තිමත් කිරීමට සහ ආරක්ෂා කිරීම සඳහා **SSI** හි කළමනාකාරීත්වයට ස්ථාපිත කළ හැකි පොදු පාලනයන් (general controls) තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(ii) වැටුප් සැකසීමේ පද්ධතියේ අන්තර්ගත සහ එයට ඇතුලත් කරනු ලබන තොරතුරු ශක්තිමත් කිරීමට සහ ආරක්ෂා කිරීම සඳහා **SSI** හි කළමනාකාරීත්වයට ස්ථාපිත කළ හැකි යෙදවුම් පාලනයන් (application controls) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(B) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත පෙරේරා ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** විගණනය භාර ජ්‍යෙෂ්ඨයා **සමීර** වන අතර, සමාගමේ 2016 මාර්තු 31 සහ 2015 මාර්තු 31 දිනයන්ගෙන් අවසන් වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන වලින් පහත ශේෂ උපුටා ගන්නා ලදි:

| | **2016 (රු.)** | **2015 (රු.)** |
|---|---|---|
| විකුණුම් | 1,005,630 | 700,250 |
| විකුණුම් පිරිවැය | (553,000) | (357,120) |
| **දළ ලාභය** | **452,630** | **343,130** |
| දේපළ, පිරියත හා උපකරණ - පිරිවැයට | 8,000,000 | 500,000 |
| වෙළෙඳ ණයගැතියෝ | 209,500 | 116,700 |
| බැංකු ණය | 350,000 | 500,000 |

(1) සමාගමේ ණයගැතියන් 5 දෙනෙකු පමණක් සිටී. එක් ණයගැතියෙකුගෙන් ලැබිය යුතුව තිබූ ශේෂය බොල්ණයක් ලෙස ලියාහරින ලදි. **සමීර** විසින් පසු ණය තිරවුල් කිරීම් පරීක්ෂා කිරීම සඳහා ණයගැතියන් තුන් දෙනෙකු තෝරාගත් අතර, එම තුන් දෙනාම, පියවීම් කිසිවක් පසුව සිදුකර නොතිබුණි.

(2) යන්ත්‍ර සම්බන්ධයෙන් සැලකිය යුතු වැඩිවීමක් සිදුවී තිබූ බව දේපළ, පිරියත හා උපකරණ පිළිබඳව වූ මූලික විශ්ලේෂණාත්මක සමාලෝචනයේදී **සමීර** අවධානයට ලක් කර තිබුණි.

(3) **සමීර** විසින් බැංකු ණයෙහි ණය ගිවිසුම පරීක්ෂාවට ලක් කරන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත (1) සිට (3) දක්වා වූ අයිතම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම සඳහා **සමීර** විසින් ඉටුකළ යුතු අතිරේක විගණන පටිපාටි දෙකක්(02) බැගින් **හඳුනා දක්වන්න**. (ලකුණු 06)

(b) උපුටා ගත් මූල්‍ය ප්‍රකාශන වල දී ඇති තොරතුරු මත පදනම්ව, වෙළෙඳ ණයගැතියන් සහ දළ ලාභය සඳහා ඉටුකළ යුතු විශ්ලේෂණාත්මක පටිපාටිය බැගින් **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(c) කාලපරිච්ඡේදය අවසානයේ මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ශේෂයන් පිළිබඳ සැඳහුම් (assertions) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) කිරි නිෂ්පාදිත නිෂ්පාදනය කර විකිණීමෙහි යෙදී සිටින පරිපාලිත සමාගම් 3 ක් සහිත **සීමාසහිත අඹතලේ ඩේරි ප්‍රොඩක්ට්ස් (පෞද්ගලික) සමාගමේ (ADP)** විගණනය බාර ජ්‍යෙෂ්ඨයා ලෙස ඔබ පත්කර ඇත. **ADP**, ඔබගේ විගණන සමාගමට අලුතෙන් එකතු වූ විගණන සේවාදායකයෙකි.

සමාගමේ ගණකාධිකාරී වර්ෂ අවසානයට මාස 2 කට පෙර, සේවයට බඳවාගත් කෙනෙකි. වර්තමාන ගණකාධිකාරී වර්ෂය තුළ ගණකාධිකාරී තනතුරට පත්කරගන්නා ලද 3 වන තැනැත්තාය. තවද ඔහු වෘත්තීය සුදුසුකම් ලබාගත් තැනැත්තෙකු ද නොවේ.

**"ව්‍රීමෝ"** නම් වූ අලුත් තරඟකරුවෙකු **ADP** කර්මාන්තයට මතු වී ඇති බව අලෙවි කළමනාකරු විසින් සඳහන් කරන ලදි. ප්‍රචාරණ සහ ප්‍රවර්ධන කටයුතු සඳහා විශාල ආයෝජනයක් කර ඇති **ව්‍රීමෝ** වෙළෙඳපොළ තුළ සැලකිය යුතු කොටසක් අත්පත් කරගෙන ඇත. එමනිසා, **ADP** නිෂ්පාදිත වලට ඇති ඉල්ලුම සීඝ්‍ර ලෙස පහත බසිමින් තිබේ.

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු තහවුරු කළ විට, අන්තර් සමාගම් වෙත සැලකිය යුතු විකුණුම් ප්‍රමාණයක් වර්ෂය අවසානයට ආසන්නව සිදුකර ඇති බව ඔබ හඳුනාගෙන ඇත. අදාල සම්බන්ධිත පාර්ශවයන්ගෙන් සෘජුවම සනාථ කිරීම් ලැබී ඇති අතර, ඒවා ලෙජර් ශේෂ සමග එකඟ වී තිබේ.

ගෙවීම් සමාලෝචනය කිරීමේදී, සැලකිය යුතු තරම් ප්‍රමාණයක් නීතිඥයෙකුට ගෙවා ඇති බව සොයාගෙන ඇත. එසේ වුවද, එම ගෙවීම් සඳහා ආධාරක ලියවිලි ද තිබේ.

ගිණුම් දෙපාර්තමේන්තුවේ ගිණුම් විධායකයෙකු සිටී. ප්‍රදේශයේ කිරි ගොවීන්ගෙන් කිරි එකතු කිරීමට සහ ඔවුන් වෙත ගෙවීම් කිරීමට ඔහු වගකිව යුතු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණන අවදානම යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) **ADP** සහ එහි පරිසරය පිළිබඳව ඔබ අවබෝධයක් ලබා ගත යුතු ක්ෂෙත්‍ර (areas) තුනක්(03) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 03)

(c) **ADP** හි විගණනය ඉටුකිරීමේදී සැලකිය යුතු තරමේ අවදානම් පෙන්නුම් කෙරෙන ක්ෂෙත්‍ර හතරක්(04) **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

(d) **ADP** හි ස්ථාවර විගණන ගොනුවේ ඔබ විසින් අතුලත් කරනු ලැබිය හැකි තොරතුරු වර්ග දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(B) **සීමාසහිත MN (පෞද්ගලික) සමාගමේ** විගණනය භාර ජ්‍යෙෂ්ඨයා ඔබය. එහි ඉඩම් අගය කිරීම සඳහා **සීමාසහිත MN (පෞද්ගලික) සමාගම** ප්‍රත්‍යාගණන ආකෘතිය (revaluation model) භාවිත කරයි. ප්‍රත්‍යාගණනයෙන් වර්ෂ 5 කට පසු ඉඩම් වල වෙළෙඳපොළ අගය සැලකිය යුතු තරමින් වැඩිවී ඇති බව කළමනාකරණය හඳුනාගෙන ඇත. එමනිසා කළමනාකරණය විසින් ප්‍රවර්තන වර්ෂයේ දී නැවත ප්‍රත්‍යාගණනයක් සිදුකරන ලදි. **AB වැලුවර්ස්** විසින් ඉඩම් අගය කිරීමේ ඇගයීම් සිදුකරන ලදි. ඇගයීම් වාර්තාවේ පිටපතක් ඔබ වෙත ද සපයා ඇත.

සමාගම එහි ගොඩනැගිලි අගය කිරීම සඳහා පිරිවැය ආකෘතිය (cost model) භාවිත කරයි. ජල ගැලීම් නිසා එක් ගොඩනැගිල්ලක කොටසකට හානි වී තිබේ. එමනිසා සමාගම හානිකරණය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. හානිකරණ ප්‍රතිපාදනය සම්බන්ධයෙන් කළමනාකරණයෙන් නියෝජනයක් ඔබ ලබාගෙන ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉඩමේ ඇගයීම් සමාලෝචනයේදී ඉටුකළ යුතු විගණන පටිපාටි දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(b) "කළමනාකරණයේ ලිඛිත නියෝජනයක්" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) විගණන සාක්ෂියක් ලෙස කළමනාකරණ නියෝජනයක ගුණාත්මකභාවය සහ විශ්වසනීයභාවය පිළිබඳව **විමසන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |